# කරුණු මත කෙටි සටහනක්

1. නිහාල් ශ්‍රී අමරසේකර, හිල්ටන් හෝටලයේ හිමිකාර සමාගම වූ හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) පීඑල්සී(HDL) හි මුලාරම්භයේ සිටම එහි ප්‍රවර්ධකවරුන් සහ අධ්‍යක්ෂකවරුන්ගෙන් කෙනෙකු වූ අතර පසුව එහි සභාපති විය.

2. කොළඹ හිල්ටන් හෝටලයේ ඉදිකිරීම් කටයුතු රාජ්‍ය ඇපකර මත මිට්සුයි සහ සමාගම සහ තායිසෙයි සමාගමේ මූල්‍ය දායකත්වයෙන් සිදු කෙරුණේ, 1983 වාර්ගික කෝලහල පසුබිම මත, රටේ ජාත්‍යන්තර ප්‍රතිරූපය නැවත ප්‍රතිස්ථාපනය කර දියුණු කිරීමේ අභිලාශයෙනි.

3. හිල්ටන් හෝටලයේ ඉදි කිරීම් 1984 වර්ෂයේදී ආරම්භ කෙරුණු අතර, හිල්ටන් හෝටලයේ මෙහෙයුම් කටයුතු 1987 වර්ෂයේදී ආරම්භ කෙරුණි.

4. බාධා කිරීම් සහ පීඩනයන් මධ්‍යයේ, අමරසේකර විසින් 1990 සැප්තැම්බර් මස මහා පරිමාණ වංචාවක් මත නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1991 ඔක්තෝබර් මස දිස්ත්‍රික් අධිකරණය විසින් රාජ්‍ය ඇපකර යටතේ රජය විසින් හෝ හොටෙල් ඩිවලොවර්ස් (ලංකා) පීඑල්සී (HDL) විසින් මිට්සුයි සහ සමාගම වෙත සහ තායිසෙයි සමාගම වෙත වන සියලු ගෙවීම් අතුරු තහනම් නියෝග මගින් තහනම් කරන ලද අතර, 1992 දෙසැම්බර් මසදී එය ශ්‍රේෂ්ඨාධිකරණයේදීද තහවුරු විය.

5. ඔහු විසින් 1990 සැත්තැම්බර් මස සිදු කරනු ලැබූ එම නීතිමය ක්‍රියාමාර්ගය මත,රාජ්‍ය ඇපකර යටතේ රජය විසින් හෝ හොටෙල් ඩිවලොවර්ස් (ලංකා) පීඑල්සී (HDL) විසින් මිට්සුයි සහ සමාගම වෙත සහ තායිසෙයි සමාගම වෙත කිසිදු අයුරක ගෙවීමක් වළක්වාලමින් දිස්ත්‍රික් අධිකරණය විසින් වහාම වාරණ නියෝග නිකුත් කිරීමට කටයුතු කල අතර, එමගින් **විදේශ විනිමය සංචිත ප්‍රමාණය ඉතා අවම මට්ටමක පැවති එම අවස්ථාවේදී,** රටේ විදේශ ණය ගැනීම් සම්බන්ධ ජාත්‍යන්තර හරස් පැහැර හැරීම අවක්ෂේපණය වැලක්වුනි.

6. හොටෙල් ඩිවලොවර්ස් (ලංකා) පීඑල්සී (HDL) විසින් වාර්ෂික ගිණුම් ප්‍රකාශ කිරිම තහනම් කිරිමට අවශ්‍ය පියවර ගැනීම සඳහා අධිකරණය විසින් තහනම් නියෝග ලබා ගැනීම උදෙසාද, අමරසේකර විසින් තවදුරටත් නඩුවක් ගොනු කරන ලදී.

7. දිස්ත්‍රික් අධිකරණයේදී මිට්සුයි සහ සමාගම සහ තායිසෙයි සමාගම වෙත ඉදිරිපත් කරනු ලැබූ විචාරණවලට පිළිතුරු සැපයීමට අපොහොසත් වීම මත, ජපාන තානාපති මුදල් අමාත්‍යාංශය සමග මැදිහත් වී මෙම කාරණය සමථයකට පත් කරන ලෙස සහ විසඳන ලෙසට ඉල්ලා සිටින ලදී.

8. අමරසේකර විසින් රජය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට එකඟ වී, ඒ සඳහා සාකච්ඡා පැවැත්වීමෙන් අනතුරුව, ගරු. නීතිපති විසින් එවැනි බේරුම්කරණයක් සඳහා 1993 ජුනි මසදී ගිවිසුම් කෙටුම්පත් සකස් කරනු ලැබීය.

9. අමරසේකරගේ දැඩි ඉල්ලීම් මත, වර්ෂ අටක් සඳහා උපචිත පොලිය සහ 30 % ක ප්‍රාග්ධනය කපා හැරීමට සහ කපා නොහරින ලද ඉතිරි ණය ශේෂය වර්ෂ 13 ක් දක්වා 5.9 % ක වාර්ෂික පොලී අනුපාතයක් මත දීර්ඝ කිරිමට මිට්සුයි සහ සමාගම සහ තායිසෙයි සමාගම විසින් එකඟ වන ලදී.

10. රාජ්‍ය ඇපකරයන්ට අමතරව, කපා නොහරින ලද ණය ශේෂය වෙනුවෙන් රජයෙන් නිකුත් කරනු ලැබූ පොරොන්දු පත්‍රයන් මිට්සුයි සහ සමාගම සහ තායිසෙයි සමාගම් විසින් ඉල්ලා සිටීම නිසා, එම ගිවිසුම් අවසන් කර ගැනීමට එය බාධාවක් විය.

11. ඉන් අනතුරුව, මිට්සුයි සහ සමාගම සහ තායිසෙයි සමාගම් විසින් රජය වෙතින් නොව ඒ වෙනුවට හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) පීඑල්සී (HDL) වෙතින් කපා නොහැරිය ශේෂය සඳහා පොරොන්දු පත්‍ර ලබා ගැනීමට එකඟ වූ අතර, ගරු. නීතිපති විසින් තවදුරටත් සකසා අවසන් කරනු ලැබූ ගිවිසුම්, අමාත්‍ය මණ්ඩලයේ සහ විශේෂ ජනාධිපති කොමිසමේ අනුමැතිය ලැබීමෙන් පසු 1995 ජූනි මස මහා භාණ්ඩාගාරය විසින් අත්සන් කරනු ලැබීය.

12. ඉහත සඳහන් ගිවිසුම් තුල, වර්ෂ දහයක් සඳහා උපචිත පොලිය සහ 30 % ක ප්‍රාග්ධනය කපා හැරීමට සහ කපා නොහරින ලද ඉතිරි ශේෂය ඉදිරි වර්ෂ 16 ක් දක්වා 5.25 % ක වාර්ෂික පොලී අනුපාතයක් මත දීර්ඝ කිරීමට මිට්සුයි සහ සමාගම සහ තායිසෙයි සමාගම අමරසේකරගේ බලපෑම් වලට එකඟ විය.

13. ඉහත කපා හරින ලද හිමිකම් වටිනාකම රාජ්‍ය ඇපකරයන්ගෙන් 62% ක් වූ අතර, එය1995 ජූනි මසට ජපන් යෙන් මිලියන 17,586 ක්, එවකට ඇමරිකානු ඩොලර් මිලියන 207 ක් හෝ ශ්‍රී ලංකා රුපියල් මිලියන 10,200 ක් විය.

14. ගිවිසුම් වල සඳහන්ව ඇති පරිදි, ඉහතකී කරුණු මත රජය සහ හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී (HDL) විශාල ප්‍රතිලාභ ලද බව රජය විසින්ම පිළිගෙන ඇත.

15. වටිනාකම අනුව, 2016.12.31දිනට ඉහත කපා හැරීම් තැන්පත් පොලී අනුපාතය අනුව වටිනාකම රුපියල් මිලියන 89,927.6 ක් වන අතර, නැවත සකස් කරනු ලැබූ ශේෂයේ වටිනාකම රුපියල් මිලියන 51,884.7 කි.

16. අමරසේකර විසින් ඔහුගේ නඩු දෙක ඉවත් කර ගැනීමට ප්‍රථම, ශ්‍රී ලංකා රජය සහ මිට්සුයි සහ සමාගම සහ තායිසෙයි සමාගම අතර වූ ගිවිසුමෙහි, 'පූර්ව කොන්දේසි' වශයෙන් කොන්දේසි කිහිපයක් ඉහත ගිවිසුම් වල අඩංගු කර තිබුණි.

17. සාපරාධිත්වය පිළිබඳ බිඳලිය නොහැකි සාක්ෂි විශේෂ ජනාධිපති කොමිසම ඉදිරියේ අනාවරණය වීමත් සමඟම, මිට්සුයි සහ සමාගම සහ තායිසෙයි සමාගම විසින් ජපාන රජය හරහා ශ්‍රී ලංකා රජය වෙත පීඩනය ඇති කරමින්, 1996 නොවැම්බර් මස පැවත්වීමට නියමිතව තිබූ ආධාර කණ්ඩායම් රැස්වීමේදී, ඇමරිකානු ඩොලර් මිලියන 275 ක ජපන් ආධාර මුදා නොහරින බවට තර්ජනය කරනු ලැබීය.

18. එවැනි තත්වයක් මත, ශ්‍රී ලංකා රජය විසින් අමරසේකර සමඟ මැදිහත්ව කටයුතු කරමින්, 'පූර්ව කොන්දේසි' සම්පූර්ණ කිරීමට ප්‍රථම, ඔහුගේ නඩු දෙක ඉවත් කර ගැනීමට එකඟ කරවා ගැනීමට නම්මා ගනිමින්, ඔහු විසින් නඩු දෙක බෙරුම්කරණය කර ඉවත් කර ගැනීමට පූර්වයෙන් සම්පූර්ණ කල යුතු වූ 'පූර්ව කොන්දේසි' 'පසු කොන්දේසි' වශයෙන් සළකා සම්පූර්ණ කිරීමට එකඟ වීමටද අමරසේකරව එකඟකර ගන්නා ලදී.

19. ඒ අනුව, ගරු නීතිපති විසින් 'පූර්ව කොන්දේසි' 'පසු කොන්දේසි' වශයෙන් වන පරිදි පරිවර්තනය කරමින් ඉහත ගිවිසුම්වලට සකස් කරනු ලැබූ පරිශිෂ්ටය, එය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති බැවින්, මහා භාණ්ඩාගාරය විසින්, අමරසේකර, මිට්සුයි සහ සමාගම සහ තායිසෙයි සමාගම සමඟ අත්සන් කරන ලදී.

20. ඉහත පරිශිෂ්ටය තුල, අනෙකුත් කරුණු අතරතුර, පහත සඳහන් පරිදි එය වාර්තා කර ඇත:

> **"ශ්‍රී ලංකා රජයට කිසිම බාධාවක් නොමැතිව ජපන් රජය සමඟ සුහද සබඳතා පවත්වා ගෙන යැමට අවශ්‍ය බැවින් රජයද එම ඉහතකී ගිවිසුම් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම ගැන සැලකිලිමත් වී ඇත.**

මෙම තත්වය තුල, රජය, <u>**අමරසේකරගේ කැමැත්ත සහ එකඟතාවය මත,**</u> දැන් එකගවී ඇත්තේ ගිවිසුම් අංක 3 සහ 4 හි නියම කර ඇති කොන්දේසි සම්පූර්ණ කිරීමට පෙර, ගිවිසුම් අංක 1 සහ 2 හි කොන්දේසි ක්‍රියාත්මක කර ගෙන යාම සඳහා එකඟ වීමය. **රජය විසින්, ගිවිසුම් අංක 3 සහ 4 යටතේ ඇති කොන්දේසි ක්‍රියාත්මක කිරීමට අදාල නීති අනුව පරිපාලනමය වශයෙන් කටයුතු කිරීමට රජය වගකීමෙන් බැදී සිටියේය.**"

21. රැස්වීම් සටහන් හි වාර්තා වී ඇති පරිදි, හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) සමාගමෙහි (HDL) මාණ්ඩලික රැස්වීමේදී ඉහත ගිවිසුම් බලාත්මක කිරීම සඳහා, එම මහා භාණ්ඩාගාරය නියෝජිත රැස්වීමේ මුලසුන හෙබවූ නිලධාරී විසින් පහත සඳහන් ලෙස ප්‍රකාශ කර ඇත.

> **"සභාපති වූ ආචාර්ය පී. බී. ජයසුන්දර මුලින්ම කියා සිටියේ මෙම මණ්ඩල රැස්වීම පවත්වනු ලබන්නේ, රජයේ න්‍යාය පත්‍රයට අනුව, ජාතික වැදගත්කමක් ඇති ප්‍රශ්නයක් වන ශ්‍රී ලංකාව සහ ජපානය අතර මිත්‍රශීභාවය ඉදිරියට ගෙන යාමට රජය ඔහුට දුන් නිර්දේශයක් අනුව බවත්, ඒ අනුව අනෙක් අධ්‍යක්ෂවරුන්ගෙන් ඉල්ලා සිටියේ රැස්වීම ඔවුන් ඉදිරියේ ඇති න්‍යාය පත්‍රය අනුව පැවැත්වීමටය. අනිකුත් සියළු දෙනා එකඟ විය"**

22. ඉහත පරිශිෂ්ටය <u>**1996.10.21**</u> දින අත්සන් තැබූ අතර, අමරසේකරගේ නඩුදෙක<u>**1996.10.23**</u> දින ඉහත ගිවිසුම් / පරිශිෂ්ටය මත සමථයකට පත් කර ඉල්ලා අස්කර ගන්නා ලද අතර, හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) සමාගමෙහි (HDL) මාණ්ඩලික රැස්වීම <u>**1996.10.25**</u> දින පැවති අතර, අමරසේකර විසින් ලබා ගත් අතුරු තහනම් නියෝගය හේතුවෙන්, හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) සමාගමෙහි (HDL) එකතු වී තිබූ අරමුදල වන **ඇමරිකානු ඩොලර් මිලියන 30** මගින් මිට්සුයි සහ සමාගම සහ තායිසෙයි සමාගම යන ජපන් සමාගම් වෙත ගෙවීම <u>**1996.10.28**</u> දින සිදු කරන ලදී. *අමරසේකර විසින් රජයේ ඇයදීම් වලට එකඟ වීමෙන් එම අවශ්‍යතාවයන් ඉටු කිරීමට ඉහත කී ලෙස ඉතාමත් සහයෝගයෙන් කටයුතු කරන ලදී.*

23. අමරසේකර විසින් ප්‍රකාශ කර සිටින්නේ රජය විසින් ඇයද සිටි පරිදි, අමරසේකර විසින් එම නඩු දෙක සමථයකට පත් කර ඉවත් කර නොගත්තේ නම්, එම කාලයේදී අමරසේකර විසින් ලබා ගෙන තිබූ අතුරු තහනම් නියෝග මත, පහසුවෙන්ම ඔහුගේ මෙම නඩු දෙක සාර්ථකව ඔප්පු කිරීමට හැකියාව තිබීමෙන්, හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) සමාගමෙහි (HDL) රැස්ව තිබූ **ඇමරිකානු ඩොලර් මිලියන 30 ක** සමුච්චිත අරමුදල තවදුරටත් වැඩිකර ගෙන ඉන්පසු එම මුදල්වලින් මිට්සුයි සහ සමාගම සහ තායිසෙයි සමාගම සමඟ ව්‍යාපාරික කටයුත්තක් ලෙස බේරුම් කර, ඒ අනුව රාජ්‍ය ඇපකර අවලංගු කිරීමටද අවස්ථාව තිබුණු අතර, ශ්‍රේෂ්ඨාධිකරණය මගින් තහවුරු කර තිබූ පරිදි එසේ ජය ගැනීමට මනා හැකියාවක් තිබුණු බවය.

24. අමරසේකර විසින් ප්‍රකාශ කර සිටින්නේ, රජයේ අයදීම්වලට ඉහත කී ලෙස ක්‍රියා නොකර සිටියේ නම්, මිට්සුයි සහ සමාගම සහ තායිසෙයි සමාගම වෙත ලබාදී තිබූ රාජ්‍ය ඇපකර අවලංගු වීමෙන්, අද දින හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) සමාගමෙහි (HDL) වර්තමාන ප්‍රධාන කොටස්කරුවෙකු වන්නේ රජය නොව ඔහු විය හැකිව තිබූ බව සහ එය ඔහු සතුව පැවති තනි බලය මත ගත හැකිව තිබූ හොඳම සහ නිවැරදිම ව්‍යාපාර තීරණය විය හැකිව තිබූ බවත්, නමුත් ඔහු රජයේ අයදීම්වලට සවන් දෙමින් සහ රජයේ අයැදීම් මත එසේ කටයුතු කරනු ලැබුවේ, ඔහුගේ එම නෛතික අයිතීන්ද අත්හරිමින්, ශ්‍රී ලංකා රජයට ජපාන රජය විසින් කළ බලපෑම් **හේතු කොට ගෙන බවත්ය.**

25. මීට අමතරව, අමරසේකර විසින් පහත සඳහන් පරිදි දායකත්වය ලබා දුන් බව ඔහු විසින් ප්‍රකාශ කර ඇත.

i) මිට්සුයි සහ සමාගම සහ තායිසෙයි සමාගම වෙත නිකුත් කරනු ලැබූ රාජ්‍ය ඇපකරයන්ට අමතරව, HDL සමාගම හොර රහසේ කොළඹ හිල්ටන් හෝටලය සහ නාගරික සංවර්ධන අධිකාරියේ ඉඩම් උකස් කිරීමට තැත් කිරීම 1989 දී ඔහු විසින් වලක්වාලන ලදී.

ii) නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩම්හි කල් බදු නිශ්ප්‍රභා කිරීමට රජයට සහාය දැක්වූ අතර, 1999 ජූලි මස ක්‍රියාත්මක කරන ලද විශේෂ ප්‍රදාන පත්‍රයන් මගින් එම ඉඩම් නැවත රජය වෙත ලබා ගැනීමට ඔහු විසින් දායකත්වය ලබා දී ඇත.

iii) හිල්ටන් හෝටලය ත්‍රස්ත බෝම්බ ප්‍රහාරයෙන් විනාශ වීම මත, ලද ඇමරිකානු ඩොලර් මිලියන 10 ක රක්ෂණ මුදල් හිල්ටන් ජාත්‍යන්තර සමාගමට අයත් යයි වංචනික ලෙස හිමිකම්පෑමෙන් එයින් එක්සත් ජනපද ඩොලර් මිලියන 7 ක් සඳහා නාමික අගය මත HDL සමාගමේ කොටස් ලබා දෙන ලෙසට ඉල්ලා සිටි අතර, එමගින් හිල්ටන් ජාත්‍යන්තර සමාගමේ 50.1% පාලනය කරන කොටස් ප්‍රමාණයක් ලබා ගැනීමට ගත් උත්සහය ඔහු විසින් සාර්ථක ලෙස වලක්වාලන ලදි. එසේ නොවූයේ නම් මිට්සුයි සහ සමාගම සහ තායිසෙයි සමාගම 13% කොටස් හිමිකාරීත්වය සහ එමගින් රජයේ 65% ක් වූ කොටස් හිමිකාරීත්වය 32% ක් දක්වා අඩු වීමට ඉඩ තිබුණි.

iv) HDL සමාගමේ පෙර සභාපති වූ අජිත් ඩයස් විසින් ආරම්භ කර තිබූ සාකච්ඡා අවසන් කර, නව වාසිදායක කොන්දේසි සකස් කර අවසන් කර, හිල්ටන් ජාත්‍යන්තර සමාගම සමඟ පැවති කලමනාකරණ කොන්දේසි, ඒ සඳහා 2005 ඔක්තෝබර් මස අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඇතිව, ඔවුන්ට ගෙවීම් කිරීම් අඩු කර ගැනීමට කටයුතු කරන ලදී.

v) HDL සමාගමේ අධ්‍යක්ෂක සහ සභාපති ලෙස අමරසේකර කිසිදු ගාස්තුවක් හෝ දීමනාවක් ලබා නොගත් අතර, ඔහු විසින් HDL සමාගමේ වාහනයක්ද භාවිතා නොකරන ලදී.

26. ඉහත ගිවිසුම් ප්‍රකාරව, රජය විසින් අමරසේකර වෙත ගෙවිය යුතු වෘත්තීය වන්දි, ස්වාධීන මූල්‍ය / වෙළඳ බැංකු ආයතනය විසින් නිශ්චය කිරීමට එකඟ වූ අතර, ඒ අනුව මහා භාණ්ඩාගාරය විසින් එවැනි අරමුණක් සඳහා ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව නම් කරන ලද අතර, එය ශ්‍රේෂ්ඨාධිකරණයට දන්වා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එය තහවුරු කරනු ලැබීය.

27. **රජය විසින් අත්‍යවශ්‍ය කර තිබූ** ඉහත බේරුම්කරණයන් සම්බන්ධයෙන් කොනල් සහ සමාගම විසින් විරෝධතා දක්වමින්, ඒ අනුව නඩු කිහිපයක් ගොනු කරනු ලැබීය. එවැනි නඩු වලින් සාර්ථක ලෙස ජය ගැනීමට මහා භාණ්ඩාගාරයට සහ හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) සමාගමට (HDL) අමරසේකර විසින් සහාය දැක්වූ අතර, අවසාන නඩුව **2014 මැයි මසදී** නිශ්ප්‍රභා කරන ලදී.

28. **2014 ජූනි මසදී,** ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව විසින් ලබා දුන් වාර්තාව මත පදනම් වෙමින්, අමරසේකර විසින් වෘත්තීය වන්දි සඳහා ඔහුගේ හිමිකම් පෑම ඉදිරිපත් කරන ලද අතර, ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව විසින සනාථ කරන ලද වෙළඳ පොල සම්මතය අනුව කපා හැරීම් සඳහා 2% ක් වන පරිදි සහ 1.5 % මත වනික් ඉන්කෝපරේශන් සමාගම දැනුම් දී තිබූ පරිදි නැවත දීර්ඝ කිරීම සඳහා, ඔහුගේ විගණකයින් විසින් ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව විසින් ලබා දුන් වාර්තාව වර්තමාන දිනය තෙක් සකස් කරන ලදී. එසේ සකස් කරන ලද්දේ මෙය සාමාන්‍ය කර්තව්‍යක් නොව, සංකීර්ණ නඩු මගින් ලබාගත් ප්‍රතිලාභ ලෙස ගණනය නොකරමිනි.

29. අමරසේකර විසින් ප්‍රකාශ කරන පරිදි, 2014 දෙසැම්බර් මසදී, අමරසේකර විසින් අවසාන සහ සම්පූර්ණ බේරුම්කරණ වශයෙන් රුපියල් මිලියන 300 පිළිගන්නේද යන්න මහාභාණ්ඩාගාරය විසින් තුන්වන පාර්ශවයක් මගින් අමරසේකරගෙන් පණිවිඩ මාර්ගයෙන් ප්‍රශ්න කල බවත්ය. **පෞද්ගලික පීඩාකාරී සම්බන්ධතාවයක් හේතුවෙන්, ඒ පිළිබඳ කිසිදු සාකච්ඡාවක් හෝ කතිකාවක් නොමැතිවය.**

30. අමරසේකර විසින් ප්‍රකාශ කර සිටින්නේ, ඔහු සිටි තත්වය මත, ඉහත කී යෝජනාව භාර ගැනීමට සිදු වූ බවත්, එය එසේ කරන ලද්දේ 2014.12.31 දිනට පෙර එම ගෙවීම සම්පූර්ණ කරන පදනම මත බවත්ය. එතෙක් වහාම මහා භාණ්ඩාගාරය මගින්ලංකා බැංකුව හරහා රුපියල් මිලියන 100 ක බැංකු අයිරාවක් තාවකාලිකව සලසා දෙන ලදී.

31. පසුව, 2015 මාර්තු මසදී, මහා භාණ්ඩාගාරය සමඟ පැවති සාකච්ඡා මත, අමාත්‍ය මණ්ඩල සන්දේශයට පසුව,ඉහත කී බැංකු අයිරාව 2015 ජුනි මසදී රුපියල් මිලියන 225 දක්වා වැඩි කොට එය මහා භාණ්ඩාගාරයෙන් ගෙවන බවට පොරොන්දු වී තිබුණේ, මාස හයක් තුලදී අමරසේකරට රජයෙන් ලැබීමට තිබූ ඉහතකී වෘත්තීය වන්දි පියවීමෙන්ය.

32. 2016.12.31 දිනට මූල්‍ය වටිනාකම අනුව, වෙළඳපොල සම්මතය මත ඉහත කපා හැරිය වටිනාකමෙහි වෘත්තීය වන්දිය රුපියල් මිලියන 1,798.5 සහ 1.5 % ක අගය මත නැවත දීර්ඝ කිරීම රුපියල් මිලියන 778.3 වන අතර, ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව විසින් සකස් කරන ලද වාර්තා අනුව, ඔහුගේ විගණකයින් විසින් ඉහතකී දිනට සහතික කල පරිදි, වෙළඳපොල සම්මතය මත සමස්ථ වෘත්තීය වන්දිය රුපියල් මිලියන 2,567.8 ක් වී තිබුණි.

33. රජය විසින් ආපසු ගෙවීමට ගන්නා ණය වලට පවා මූල්‍ය උපදේශකයින් / වෙළඳ ආයතන වෙත වෘත්තීය ගෙවීම් සහ කොමිස් ගෙවන්නට සිදුවන අතර, ඉහත 2016.12.31 දිනට වූ මුළු වටිනාකම අනුව **රුපියල් මිලියන 89,927.6,** රාජ්‍ය ඇපකර මත, සම්පූර්ණ ණය කපාහැරීමක් සහ ඉතිරි ණය දීර්ඝ කිරීමක්ද වීමෙන්, රජය විසින් පිළිගෙන ඇති පරිදි එය රජයට හිමි වූ විශාල ප්‍රතිලාභයකි.

34. 1995 ජුනි මස ගිවිසුම් අත්සන් කිරීමට පෙර, අමරසේකර විසින් වෘත්තීය වන්දි සඳහා දර්ශකයක් ලෙස පහත සඳහන් උපුටා දැක්වීම් භාණ්ඩාගාරය වෙත ලබා දෙන ලදී.

- අර්නස්ට් සහ යංග් වෙතින් 1995.3.20 දිනැති - 1% සිට 4% දක්වා ගාස්තු
- වණික් ඉන්කෝපරේෂන් ලිමිටඩ් වෙතින් 1995.5.30 දිනැති - 1.5% පමණ ගාස්තු

**<u>ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව විසින්,</u>** කොටගල වතු සමාගම රුපියල් මිලියන 102 කොටස් විකිණීමේ ගනුදෙනුව සඳහා සකස් කිරීමට රුපියල් මිලියන 4.3 ක් අය කරනු ලැබූ බව සහ 1998.11.02 දිනැතිව, පෞද්ගලීකරණයක ලංසු තැබීම සඳහා රඳවා තබා ගැනීම් ගාස්තු වලට අමතරව 2% සිට 3% දක්වා ගාස්තුවක් සඳහන් කරන ලද බවට අමරසේකර විසින් සාක්ෂි ඉදිරිපත් කරන ලදී.

2005 ඔක්තෝබර් මස අමාත්‍ය මණ්ඩල සංදේශය මගින්, වෙනත් කරුණු අතර, පහත සඳහන් පරිදි අනුමත කරන ලදී. :

> "රජය සහ HDL සමාගම වෙත ප්‍රතිලාභ හිමිකර දෙමින්, ජපන් යෙන් මිලියන 17,586 කට (ඇමරිකානු ඩොලර් මිලියන 207 / ශ්‍රී ලංකා රුපියල් මිලියන 10,200) ආසන්න ප්‍රමාණයක් කපා හැරීම සඳහා ගත් උත්සාහය සහ කැපවීමට HDL සමාගමේ අදාල කොටස් ප්‍රමාණයක් හෝ මූල්‍ය ගෙවීමක් රජය විසින් අමරසේකර / කොමින්ඩ්ටැක්ස් මැනේජ්මන්ට් සර්විසස් ලිමිටඩ් වෙත (වර්තමානයේ කන්සල්ටන්ස් 21 ලිමිටඩ්) වෙත ගෙවිය යුතු බව සහ 1995 ජූලි

මස සිට කෝර්නල් සහ සමාගම විසින් ගොනු කිරීමට සහ ගොනු කරවාලීමට එරෙහිව රජය සහ HDL සමාගමේ අයිතීන් වෙනුවෙන් ඒවාට සහයෝගය දක්වමින් ජය ගැනීමට 1995 ජූලි මස සිට ගිය වියදම් සඳහා ඒ අනුවම ගෙවිය යුතු බවත්; රජය විසින් HDL සමාගම සහ නිහාල් අමරසේකර විසින් නඩු අංක 15322/එම්ආර් ප්‍රති ඉල්ලීම් මත පිළිවලින් ගාස්තු නොමැතිව ඉල්ලා අස්කර ගැනීම"

35. රජයේ වත්කම් විකිණීම මත රජය විසින් වෘත්තීය වන්දි ගෙවනු ලැබූ සමහර අවස්ථාවන් අමරසේකර විසින් උපුටා දක්වා ඇත. එනම්:

i) **<u>2003 වර්ෂයේදී,</u>** ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පෞද්ගලීකරණය සිදු කිරීමේදී, රජය විසින් ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස් සහ අර්නස්ට් ඇන්ඩ් යංග් වෙත **රුපියල් මිලියන 170** ඉක්ම වූ වෘත්තීය වන්දි ගෙවා ඇති අතර, 2016.12.31 දිනට එහි වටිනාකම **<u>රුපියල් මිලියන 940 වේ</u>**. එම පෞද්ගලීකරණය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිශ්ප්‍රභා කර ඇත.

ii) **<u>2003 වර්ෂයේදී</u>**, ලංකා අයිඕසී ලිමිටඩ් පෞද්ගලීකරණය සිදු කිරීමේදී, රජය විසින් අර්නස්ට් ඇන්ඩ් යංග් වෙත **රුපියල් මිලියන 55** ඉක්ම වූ වෘත්තීය වන්දි ගෙවා ඇති අතර, 2016.12.31 දිනට එහි වටිනාකම **<u>රුපියල් මිලියන 290.1</u>** ඉක්මවා යයි.

iii) **<u>2001 වර්ෂයේදී,</u>** ජාතික රක්ෂණ සමාගම පෞද්ගලීකරණය සිදු කිරීමේදී, රජය විසින් ආතර් ඇන්ඩර්සන් වෙත **රුපියල් මිලියන 135** පමණ වෘත්තීය වන්දි ගෙවා ඇති අතර, එය 2016.12.31 දිනට එහි වටිනාකම **<u>රුපියල් මිලියන 870</u>** ඉක්මවා තිබූ අතර එයද ගෙවා තිබුණේ 2001 දී කොටස් විකිණීමෙන් ලැබුණු **රුපියල් මිලියන** 450 කටය !

iv) ඛනිජතෙල් හෙජින් නඩු වලදී, ගරු නීතිපති විසින් ගත්ප්‍රශ්න සහගත ස්ථාවරයක් මත වෘත්තීය ගාස්තු සහ වියදම ලෙස **<u>රුපියල් මිලියන 1,232</u>** ක වියදමක්දැරූ බව කෝප් වාර්තාවේ වාර්තා කර ඇති අතර, එහිදී ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැංකුවේ හිමිකම් ***ඇමරිකානු ඩොලර් මිලියන 160 + පොලිය*** සහ ඩොයිෂ් බැංකුවේ හිමිකම් **<u>ඇමරිකානු ඩොලර් මිලියන 80 + පොලිය</u>**ශ්‍රීලංකා රජයට ගෙවීමට සිදුවිය.

සිටි බැංකු හිමිකම් **<u>ඇමරිකානු ඩොලර් මිලියන 192 + පොලිය</u>** අමරසේකරගේ උත්සාහයන් මත වලක්වා ගනු ලැබුවේ යයි විශ්වාස වේ.

36. මීට අමතරව, **හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) සමාගමෙහි (HDL) අධ්‍යක්ෂ මණ්ඩලයේ ඔහුට ප්‍රමාණවත් නියෝජනයක්** ඇතිකිරීම සඳහා ඉහත කී ගිවිසුම්වල අඩංගු කර තිබූ අතර, **එසේ පත් කිරීමට ඔහුගේ නාම යෝජනා තුනක් නියම කර තිබුණි.**

එස්. පී. ශ්‍රීස්කන්ත, එල්එල්. එම් (එ.රා.),
නීතිඥ,
සොලිස්ටර් (එංගලන්තය සහ වේල්ස්)

මුල් පිටපත 2016.9.30
යාවත්කාලීන කිරීම 2017.1.1